**මීගමුව මහා නගර සභාව - 2021**
**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

මීගමුව මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මීගමුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවූවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට **අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රමිත අංක 3.5 අනුව හා LGD/10A/4/න.ගි/2019 අංක දරන පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 12 දිනැති ලිපිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සභාව සතු දේපළ, පිරියත හා උපකරණ වර්ග 14 ක් යටතේ වර්ගීකරණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සභාව සතු ඉඩම්, ගොඩනැගිලි, කාර්යාලයීය උපකරණ, පරිගණක හා පරිගණක මෘදුකාංග යනාදී වත්කම් හඳුනාගෙන කාණ්ඩගත කිරීම කර නොතිබුණි. | ස්ථාවර වත්කම් කාණ්ඩ ගත කිරීමේ කටයුතු දැනට කර ගෙන යමින් පවතින අතර ඉදිරි වර්ෂයේදී ප්‍රකාශනවල ඇතුළත් කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට හා පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ආ) ප්‍රමිත අංක 18.7 හා LGD/10A/4/න.ගි./2019 අංක දරන පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති ලිපිය ප්‍රකාර සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු වුවද සභාවේ දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | හැකි ඉක්මනින් අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ඇ) ප්‍රමිත අංක 6.11 ප්‍රකාරව සෑම කාල පරිච්ඡේදයකදීම දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීමේ වියදම අතිරික්තයට හෝ ඌනතාවයට හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද සභාව සතු දේපළ, පිරියත හා උපකරණ ඒ අනුව ක්ෂය කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. | |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී, පෙර වර්ෂවලට අදාලව බාහිර පාර්ශවයන්ගෙන් ලැබූ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම් රු.35,256,464 ක් සඳහා පෙර වර්ෂවලට අදාළ ණයහිමියන්ට වූ ගෙවීම් රු.33,970,335 ක් වූයෙන් ඉතිරි රු.1,286,129 ක මුදල සඳහා ණයහිමියන් ලෙස ගිණුම්වලට ගෙන නොතිබුණි. | ජර්නල් සටහනක් මගින් නිවැරදි කරන බව දන්වමි. | |
| (ආ) | ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු.59,030,161 න් ව්‍යාපෘති 63 ක වැඩ අවසන් කර තිබුණද එම වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ගිණුමේ සටහන් අංක 10 යටතේ ඇතුළත් කර නොතිබුණි. පෙර වර්ෂය වෙනුවෙන් ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන රු.35,256,464 ක් හා සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු.1,973,430 ක ප්‍රාග්ධන ප්‍රදාන කොටසක එකතුව වූ රු.37,229,894 ක් පමණක් සටහන් අංක 10 යටතේ ගිණුම්ගත කර තිබුණද එම වටිනාකම ආදායමට හඳුනා නොගෙන කෙටිකාලීන ගෙවිය යුතු දෑ ලෙස ජංගම වගකීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේම සටහන් අංක 05 යටතේ පූර්ව වර්ෂයේදී ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන මගින් එම ප්‍රදාන යොදවන ලද වත්කමට අදාල ක්ෂය ප්‍රතිශතය යටතේ කරනු ලබන ගණනය කිරීමට අනුව ලබාගන්නා ක්‍රමක්ෂය වටිනාකමට පුනරාවර්ථන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් වශයෙන් ගිණුම්ගත කළ යුතුය. නමුත් පූර්ව වර්ෂය වෙනුවෙන් ලද ප්‍රාග්ධන වියදම් ක්‍රමක්ෂය වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කරගත් බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා බාහිර පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ව්‍යාපෘති 60 ක කර්මාන්ත ණයගැතියන් රු.57,056,731 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහනක් මගින් නිවැරදි කරන බව දන්වමි. | |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති 64 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු කර්මාන්ත ණයහිමියෝ රු.59,461,946 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් එම වටිනාකමින් කර්මාන්ත ණයහිමියෝ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ජර්නල් සටහනක් මගින් නිවැරදි කරන බව දන්වමි. | |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දිනට රු.180,494,981 ක විවිධ ණයහිමි ශේෂය ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත්තේ ණයහිමියන්ට වැඩිපුර ගෙවූ රු.6,763,982 ක ජංගම වත්කමක් අඩුකිරීමෙන් පසුව වූ ශේෂය බැවින් එම ප්‍රමාණයෙන් ණයහිමියන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම් මගින් ගැළපීමට කටයුතු කරන බව දන්වමි. | |

| | | | |
|---|---|---|---|
| (ඊ) | කාමච්චෝඩය ඩඩ්ලි සේනානායක මධ්‍යම වෙළඳ පොළ (අදියර1) ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් 2021 ඔක්තෝබර් 13 දින ලද රු.38,840,000 ක ණය මුදල 2021 දෙසැම්බර් 06 දින සභාව විසින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. නමුත් මූල්‍ය ප්‍රකාශනවල එම මුදල ආයෝජන හා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය ලෙස දක්වා නොතිබීමෙන් ගෙවිය යුතු දිගු කාලීන ණය හා ආයෝජන එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ජර්නල් සටහනක් මගින් නිවැරදි කරන ලද බව දන්වමි. | |
| (උ) | සභාව සතු මස් කඩ 07 ක බදුකරුවන් වෙත කොවිඩ් වසංගතය හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලබාදී තිබුණු රු.310,774 ක් වූ බදු සහන වටිනාකම වර්ෂයේ බිල් කළ වටිනාකමින් ඉවත් කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඌ) | සමාලෝචිත වර්ෂයට අදාළ වරිපනම් අතිරේක හර හා දඩ මුදල් රු.5,020,376 ක් බිල් කළ මුදලක් ලෙස වරිපනම් ගිණුමට බැර කිරීම වෙනුවට හිඟ හිටි වෙනත් ආදායම් ගිණුම බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා හිඟහිටි වෙනත් අදායම් ගිණුම් එම වටිනාකමින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (එ) | හුවමාරු නොවන ගනුදෙනුවලින් ලැබිය යුතු දැ රු.203,451,284 ක් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ දක්වා තිබුණේ ගෙවිය යුතු ලෙස සඳහන් ගිණුම් 03 ක ශේෂ එකතුව වූ රු.243,670 ක් අඩු කිරීමෙන් පසුව වූයෙන් එම වටිනාකමින් ලැබිය යුතු ශේෂය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී ගිණුම් තැබීමේදී නිවැරදි කරන බව දන්වමි. | |
| (ඒ) | විගණනය වෙත ඉදිරිපත් කරන ලද නව තක්සේරු වාර්තාවෙහි සඳහන්ව පවතින මෝටර් වාහන 149 ක තක්සේරු වටිනාකම රු.262,659,600 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන මඟින් ඒවායේ වටිනාකම ලෙස දක්වා තිබුණේ රු.238,216,674 ක් ලෙස වූයෙන් මෝටර් වාහන වටිනාකම රු.24,442,926 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඔ) | සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් මිලදී ගැනීම් වෙනුවෙන් වැය කර තිබූ රු.95,850,287 ක වියදම්, වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් විස්තීර්ණ ආදායම එම වටිනාකමින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ගබඩා භාණ්ඩ මිලදී ගැනීම සඳහා වැය කළ වටිනාකම වර්ෂයේ වියදම්වලට ඇතුළත් කර ඇති බව දන්වමි. | |

| | | | |
|---|---|---|---|
| (ඕ) | මහ නගර සභාව හා ජපානයේ Institute For Global Environmental Strategies ආයතනය ඒකාබද්ධව මූල්‍ය දායකත්වයෙන් ඉදිකිරීමට කටයුතු කළ සම්පත් ප්‍රතිචක්‍රියකරණ මධ්‍යස්ථානය වෙනුවෙන් 2021 මාර්තු 31 දින වන විටත් අදියර දෙකකට අදාලව රු.6,313,200 ක මුදලක් නිදහස් කර තිබු නමුත් එම ප්‍රතිචක්‍රියකරණ මධ්‍යස්ථානය ජංගම නොවන වත්කම් යටතේ හෝ කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ස්ථාවර වත්කම් ගොඩනැගිලි ලෙස ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ක) | කොච්චිකඩේ සහ තලාහේන උප කාර්යාලවල 2020 වර්ෂයේ දෙවන හා තුන්වන කාර්තු සඳහා එකතුවී ඇති දඩ මුදල් පිළිවෙලින් රු.1,286,572 ක් හා රු.411,275 ක් සභා තීරණයක් මත කපාහැර ලේඛනවලින් ඉවත් කර තිබුණ අතර එම මුදල ලැබිය යුතු වරිපනම් ගිණුමට අතිරේක බැර ලෙස ගලපා නොතිබීමෙන් එම ගිණුමේ ශේෂය රු.1,697,847 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ලේඛන ගළපා නිවැරදි කරන බව දන්වමි. | |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 07 ක 2021 දෙසැම්බර් 31 දිනට ගිණුමේ ශේෂය හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.13,923,283 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය, මූල්‍ය ප්‍රකාශන අනුව රු.194,628,157 ක් ද, ආදායම් උපලේඛනය අනුව රු.194,407,644 ක් ද හා හිඟ ආදායම් වාර්තාව අනුව ශේෂය රු.186,256,961 ක් ද විය. | නිවැරදි කරන බව දන්වමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 1.6.4 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහා නගර සභා බල ප්‍රදේශයට අයත් හෝටල් සඳහා 2020 වර්ෂයේ දෙවන, තෙවන, සිව්වන හා 2021 වර්ෂයේ පළමු කාර්තුව සඳහා භාණ්ඩ සහිතව වසා තැබීම මත සියයට 50 ක වරිපනම් බදු සහනයක් ලබා දීමට 2021 නොවැම්බර් 08 දින සභා තීරණයක් ගෙන හොටල් 04 ක් සඳහා රු.3,515,185 ක වරිපනම් බදු සහනයක් ලබාදී තිබුණද ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | රට තුළ පැවති තත්වය සලකා සභාව විසින් අදාළ බදු සහන ලබා දීමට තීරණය කර ඇති අතර, අනුමැතිය සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව දන්වමි. | පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතුවේ. |

## 1.6.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ලැබිය යුතු ගිණුම් | | |
| (i) 2021 දෙසැම්බර් 31 දිනට විවිධ අත්තිකාරම් ශේෂය හා ගබඩා අත්තිකාරම් ශේෂය තුළ පිළිවෙලින් අවුරුදු 11 කට වැඩි කාලයක් ගතවී තිබූ රු.2,181,731 ක් හා රු.677,250 ක ශේෂයන් වූ අතර ඒවා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තව දුරටත් සොයා බලා අය කර ගත හැකි මුදල් ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | අය කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) 1991 වර්ෂයේ සිට තැන්පත් කළ නමුත් අගරු වූ චෙක්පත්වල වටිනාකම රු.980,270 ක් වූ අතර එම අගරු චෙක්පත් 53 ක් සඳහා මුදල් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | තොරතුරු ලද චෙක්පත් සඳහා මුදල් අය කිරීමට කටයුතු කර ඇත. වසර 10 ට වැඩි චෙක්පත් වටිනාකම විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත කපා හැරීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. | |
| (iii) 2018 වර්ෂයේදි කොන්ත්‍රාත් ආයතනයකට ලබාදී තිබූ රු.1,102,931 ක් වූ අත්තිකාරම පියවා නොතිබූ අතර එය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. | |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| | | |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අවුරුදු 02 – 04 ත් අතර වූ රු.94,152,585 ක ණයහිමි ශේෂය තුළ විවිධ ණයහිමියන් රු.91,104,421 ක හා ගබඩා ණයහිමියන් 3,048,165 ක ශේෂයන් වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | සොයා බලා ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 1.6.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.3,187,820 ක් වූ ආයෝජන 07 ක් සඳහා ආයෝජන සහතික විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | සහතික ලබා ගැනීම සඳහා බැංකු වෙත ලිපි යොමු කර ඇත. | ආයෝජන සහතික ඉදිරිපත් කළ යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මහා නගර සභා ආඥාපනතේ 252 අධිකාරය | | | |
| (i) 188(1) වගන්තියේ (ඇ) | මෙම ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ සභාවට බලය දී ඇති හෝ නියමවී ඇති මුදල් ආපසු ගෙවීමට බලය ලබාදී තිබුණද එයට පටහැනිව නගර ශාලා වෙන් කිරීමේ ආදායම වූ රු.310,400 ක් සමුච්චිත අරමුදලට වැයබරක් කරමින් ආපසු ගෙවා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | මහා නගර සභා ආඥා පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ii) 211,216 සහ 217 වගන්තිය | අයවැය පාලනය පිළිබඳව දක්වා ඇති වගන්තිවලට පටහැනිව පෙර වර්ෂවල වියදම් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා ගැනීමට මහ නගර සභා කටයුතු නොකිරීම තුළින් පැන නගින වියදම් ආඥා පනතේ මහා නගර සභා අරමුදල ප්‍රයෝජන ගැනීම පිළිබඳව වූ 188(1) වගන්තියට පටහැනිව රු.18,542,608 ක් අරමුදලට වැය බරක් කර තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) අංක 371(5) හා (6) | 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාලව නොපියවූ පෙර ගෙවුම් රු2,264,092 ක ශේෂයක්, භාණ්ඩ ලැබීම් පත්‍රිකා (S.R.Note) නොමැතිව සමාලෝචිත වර්ෂයේ තාක්ෂණ නිලධාරිගේ නිර්දේශය මත සමුච්චිත අරමුදලට වැයබරක් කර පියවා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | | | |
| (i) LGD/10A/4/න.ගි/2019 අංක දරන 2020 සැප්තැම්බර් 18 චක්‍රලේඛයේ 03 වගන්තිය | අංක LG 23/1 හි සිට අංක LG 25/1 දක්වා ආකෘති ප්‍රකාරව ස්ථාවර වත්කම් සම්බන්ධ වෙන් වශයෙන් ලේඛන පවත්වා ගෙන යා යුතු වුවද එවැනි වත්කම් ලේඛන සභාව විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ii) 2020 අගෝස්තු 24 දිනැති අංක LGD/09/2019 (I) චක්‍රලේඛය | චක්‍රලේඛයේ එල් ජී21/2 ආකෘතියෙහි දැක්වෙන පරිදි රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි සීමා අනුමත කර ගත යුතුව තිබූ නමුත් මෙම සභාව විසින් අත්තිකාරම් ගිණුම් සීමාවන් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.58,059,856 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.12,330,794 ක් විය.

**2.2** මූල්‍ය පාලනය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 141(2) ප්‍රකාරව පළමුවන අත්සන්කරු, "ගෙවන නිලධාරියා" වශයෙන් සලකනු ලබන අතර චෙක්පතේ නිරවද්‍යතාවය පිළිබඳව ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ ගෙවන නිලධාරියාට වේ. ඒ අනුව එහි ගණකාධිකාරි අංශය ඍජු වශයෙන් සම්බන්ධ වන සෑම ගෙවීමක්ම සම්බන්ධයෙන් 2021 ඔක්තෝබර් 22 දින සිට 2021 ඔක්තෝබර් 26 දින දක්වා පොදු ගිණුමේ මුළු මුදල වූ රු.26,217,747 ක් වූ චෙක්පත් 52 ක් හා ආපදා ගිණුමේ රු.29,975 ක් වූ චෙක්පතේ මුදල සම්බන්ධයෙන් පළමු අත්සන්කරු ලෙස නාගරික ඉංජිනේරු තනතුරට මුල් වරට පත්වීම ලද නිලධාරියෙකු හට පැවරීමේ අවිධිමත්භාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. නාගරික කොමසාරිස් හා නාගරික ලේකම්වරයා පළමු අත්සන්කරු ලෙස ගණකාධිකාරිවරයෙකු පත්කරන තෙක් වගකීම භාර නොගැනීම මූල්‍ය පරිපාලනයේ දුර්වලතාවයක් ලෙස හඳුනා ගැනේ. | අවශ්‍ය අවස්ථාවකදී අත්සන් යෙදීම සඳහා නාගරික ඉංජිනේරු විසින් පළමු අත්සන යොදා ඇත්තේ සභාවේ ස්ථිර සේවක වැටුප් ගෙවීමකදි වන අතර නාගරික ලේකම් විසින් දෙවන අත්සන යොදා ඇති බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු යුතුවේ. |

**2.3** **ආදායම් පරිපාලනය**

**2.3.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ජනවාරි 01 දිනට වූ වරිපනම් බදු හිඟය, 2021 දෙසැම්බර් 31 දිනට 25,815,000 කින් වැඩිවී තිබුණි. | පෙර වර්ෂවලදී දේපළ තහනම් කිරීමේ කටයුතු සිදුකළද මෙම වර්ෂයේ වසංගත තත්ත්වය මත එසේ කටයුතු කිරීමටද හැකියාවක් නොමැති බැවින් හිඟ වරිපනම් බදු අයකිරීම දුර්වල තත්ත්වයක පත්වීමට හේතුවූ බව සඳහන් කරමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට රු.2,346,000 ක පැරණි බලපත්‍ර ගාස්තු හිඟයක් පැවතියද එය අය කර ගැනීමට නෛතික ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | වෙළඳ ස්ථාන නොපැවැත්වූ බව තහවුරු වන බැවින් නීතිමය පියවර ගැනීම ගැටළු සහගත තත්ත්වයක් බව දන්වමි. | බලපත්‍ර ලබා නොගත් ආයතන සම්බන්ධයෙන් නිතිමය පියවර ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බස්නාහිර පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2020 ජූනි 09 දිනැති අංක LGD/06/02/04/පොදු දරන ලිපිය ප්‍රකාර කොවිඩ් වසංගතය හේතුවෙන් පළාත් පාලන ආයතන සතු කඩ කාමර වසා තැබීම නිසා සහන සලසා දීමේදී, ලබා දෙන සහන හේතුකොටගෙන අත්හැරෙන මූල්‍ය වටිනාකම සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ 266 වගන්තිය (අ) යටතේ කටයුතු කළ යුතු බවට දක්වා තිබුණද 2021 වර්ෂය සඳහා සභාව විසින් කඩ කාමර 355 කට ලබාදී තිබූ රු.2,402,837 ක කුලී සහන සහ කඩ කාමර 07 කට ලබාදී තිබූ රු.310,774 ක ටෙන්ඩර් බදු සහන ලබා දිම සඳහා ලබා ගෙන තිබූ සභා අනුමැතිය ආණ්ඩුකාරවරයාට ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. තවද යථෝක්ත ලිපිය පරිදි කුලී මුදල් නිසි ආකාරව ගෙවා තිබෙන කඩ කාමර සඳහා පමණක් එම සහන ලබා දිය යුතු වුවද කඩ කාමර කුලී හිඟව පවතින කඩ කාමර 277 ක් වෙනුවෙන්ද බදු සහන ලබාදී තිබුණි. | සොයා බලා අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | බස්නාහිර පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (ඈ) | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සභාවේ කඩ කාමර සඳහා 2021 මැයි හා ජූනි මාසවල දඩ මුදල් රු.134,873 ක් කපා හැර තිබුණද ඒ සඳහා සභාවේ අනුමැතියක් ලබා ගෙන පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | බස්නාහිර පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2021 වර්ෂය සඳහා සභාවේ වත්කම් බදුදීමේදී පෙර වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේද ටෙන්ඩර් කටයුතු සිදු නොකොට සභා තීරණ මත වත්කම් 06 ක් පෙර වර්ෂවල බදු මුදලටම හා වත්කම් 07 ක් පෙර වර්ෂයේ බදු මුදලට සියයට 10 ක් එකතු කළ මුදලට පෙර වර්ෂයේ බදුකරුවන් වෙතටම ලබා දී තිබුණි. | 2022 වසරට ටෙන්ඩර් කැඳවා ලබාදී ඇති බව දන්වමි. | බස්නාහිර පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ ප්‍රකාරව හා මහා නගර සභා ආඥා පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

මහා නගර සභා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------- | ------------ |
| 2021 වර්ෂය සඳහා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට බෙදා දීම සඳහා රු.10,255,112 ක් වටිනා අභ්‍යාස පොත් මිලදී ගෙන තිබුණි. වැය ලේඛන අනුව නිකුත් කළ අභ්‍යාස පොත්වල වටිනාකම රු.3,672,292 ක් වූ අතර ඉතිරි පොත්වල වටිනාකම රු.474,358 ක් වුයෙන් රු.6,108,462 ක් වටිනා පොත්වල ඌනතාවයක් වූ අතර සභිකයන් 20 දෙනෙකු පොත් බෙදා දුන් බවට ඉදිරිපත්කළ නාමාවලියන්හී පොත් ලබාදුන් බවට සඳහන් වූ දරුවන් 5141 ක් අත්සන් කර නොතිබුණි. තවද පොත්වලින් කොටසක් මිගමුව නගරයේ පොත් වෙළඳ සැලක විකිණීමට තිබීම සම්බන්ධව පොලීසියට පැමිණිල්ලක් සිදුකර ඇති බව සඳහන් වී තිබූ අතර මේ පිළිබඳ පොලිස් පරීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් නොවුණි. | නාගරික මන්ත්‍රීවරුන්ට අදාළ නාමලේඛන ලබා දෙන ලෙස වාචිකව හා ලිඛිතව දැනුම්දී ඇති අතර ඉදිරිපත් කර ඇති නම් සඳහන් නාගරික මන්ත්‍රීවරුන් විසින් එම ලේඛන මේ වනතුරු ලබාදීමට කටයුතු කර නොමැති බව දන්වමි. | අභ්‍යාස පොත් බෙදා දීම විනිවිදභාවයකින් යුක්තව සිදු කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වානිජ පහසුකම්වලින් යුත් දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් අනුමත වී තිබූ රු.168,000,000 ක ණය මුදලක් මත 2016 මාර්තු 16 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කළද, මුල් කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතීම මත දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණය මුදල් නිදහස් කිරීම තාවකාලිකව අත්හිටුවා තිබුණි. මේ අනුව දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් 2019 ඔක්තෝබර් 30 දින වන විට බිල්පත් 08 ක් සඳහා රු.88,155,805 ක් ගෙවීම් කර තිබුණද, මුල් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ අංක 09 සිට 12 දක්වා වූ රු.38,127,107 ක බිල්පත් 04 ක් 2022 අප්‍රේල් 30 දින වන විටත් ගෙවීම් කර නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ ආරම්භ කිරීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාවට අනුව ඉදිකර තිබූ කොටස්වල තැනින් තැන පුපුරා යාම් ඇති බව වාර්තා කර තිබුණි. II අදියර සඳහා ව්‍යාපෘති උපදේශක සමාගම විසින් රු.110,371,441 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ අතර 2021 වර්ෂයේ අයවැය මඟින් මේ සඳහා ප්‍රතිපාදන වෙන්ව නොතිබූ බැවින් ඉතිරි ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය පිළිබඳව කටයුතු නොකර ඉතිරි වැඩ සඳහා 2021 ජුනි 30 දින ලංසු කැඳවීම් කර තාක්ෂණික ඇගයීම් වාර්තාව 2021 අගෝස්තු 18 දින ලබාදී තිබූ අතර ලංසු කැඳවා මාස 07 ක කාලයක් ගතවී ඇතත් ලංසුව ප්‍රදානය කිරීමට සභාව අපොහොසත්වී තිබුණි. ඉතිරි වැඩ සඳහා මූලික පිරිවැය ඇස්තමේන්තුව රු.110,371,441 ක් වූ අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට තෝරාගත් ලංසුකරුගේ ලංසුව රු.131,698,948 ක් වූයෙන් රු.21,327,507 කින් එනම් ප්‍රතිශතයක් ලෙස සියයට 19.2 කින් මිල වැඩිවී තිබියදීත් ලංසුව ප්‍රදානය කිරීමට තීරණය කර තිබූ අතර මිල වැඩිවී තිබූ අයිතමයන් සම්බන්ධයෙන් සාකච්ඡා කර එකඟතාවයකට එළඹ නොතිබුණි. අදාල කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ රු.500,000 ක් වූ ලංසු ඇපකරයේ කාලය 2021 නොවැම්බර් 23 දිනෙන් අවසන් වී ඇති අතර, ඒ සම්බන්ධව කාලය දීර්ඝ කර ගෙන නොතිබුණි. | වරලත් ඉංජිනේරුවරයා ලවා මීගමුව මහා නගර සභා නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ ඒම ඉරි තැලීම් පරීක්ෂා කරන ලදී ඒම ඉරිතැලීම් මගින් ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක දෘඪ බවට හානියක් සිදු නොවන බවට තහවුරු වී ඇති නිසා කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර ඇති අතර ඔහු සමඟ වූ ගිවිසුම අවලංගු කිරීමට ඒකඟතාවයකට පැමිණ ඇති අතර අදාල නඩු තීන්දුව ප්‍රකාශ කරන කාලය වනවිට මෙම ලංසුවට අදාළ කාලය ඉක්මවා ගොස් තිබූ අතර ඒ වනවිට රටෙහි පැවති ආර්ථික අර්බුදය හමුවේ පෙර ලබාදුන් ඉංජිනේරු ඇස්තමේන්තුව බලාත්මක නොවන හෙයින් නව ඉංජිනේරු ඇස්තමේන්තුවක් යටතේ නැවත ටෙන්ඩර් ක්‍රියා මාර්ගයකට ගොස් මේ වනවිට එහි ඉදිරි වැඩ සිදු කෙරෙමින් පවතින බව දන්වමි. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම ඒ සඳහා ප්‍රතිපාදන සලසා ගත යුතු අතර ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කැපුන්ගොඩ ශාන්ත අන්තෝනි වටරවුම් පාරේ 213/D නිවස අසල ඇති බෝක්කුව අසල සිට ඇනස්ලි වෙත්තසිංහ මහතාගේ නිවස අසල දක්වා මාර්ගයේ කාණුව හා බෝක්කු තුනක් ඉදිකොට කොන්ක්‍රීට් ස්ලැබ් කැට යොදා කාණුව හා බෝක්කු තුන ආවරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ග්‍රාම සංවර්ධන සමිතියක් සමග 2021 ජූලි 20 දින රු.1,736,442 කට ගිවිසුම්ගත වී තිබුණි. අඩි 464 කට ඇස්තමේන්තු කර තිබූ මෙම කාණුව සඳහා අඟල් 10 කම්බි 7 ක්, කාණුවේ දිග අතට බැමි 2 ක සඳහා හා පතුල සඳහා යෙදිය යුතු අතර 2022 ජනවාරි 11 දින භෞතික පරීක්ෂාවේදී කැපුම් ස්ථාන 04 කදී කම්බි 01 සිට 03 ක් දක්වා අඩුවෙන් කම්බි යොදා තිබුණි. තවද කාණුවේ කම්බි යෙදීම, සැලැස්මට අනුව ස්ථාන ගත කරද නොතිබූ අතර ගෙවීම් සඳහා ගම්පහ දිස්ත්‍රික් ඉංජිනේරුගෙන් සැදුම්ලත් කමිටුවකට යොමු කොට එම කමිටුව විසින්ද නියමිත ප්‍රමිතියට අනුව කම්බි යොදා නොමැති බව වාර්තා කර තිබූ හෙයින් මෙම කාණුව නියමිත ප්‍රමිතියට අනුව සිදු කර නොතිබූ බවට නිරීක්ෂණය කෙරේ. | නිසි ප්‍රමිතියට ඉදිකර නොතිබූ කොටස් සඳහා සම්පූර්ණයෙන් මුදල් නොගෙවීමටත් ඉතිරි කොටස් සඳහා මුදල් ගෙවීමටත් අත රැඳවුම් කාලය වසරක් දක්වා දීර්ඝ කිරීමටත් සියයට 10 දක්වා අත රැඳවුම් මුදල වැඩි කිරීමටත් තීරණය කරන ලද බව දන්වමි. | ව්‍යාපෘති සිදු කිරීමේදී නිසි අධීක්ෂණයක් සිදු කර නියමිත ප්‍රමිතියට අනුව ව්‍යාපෘති නිම කර ගත යුතුවේ. |
| (ඇ) | කාමච්චෝඩය ඩඩ්ලි සේනානායක මධ්‍යම වෙළඳ පොළ (අදියර 1) ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පිරිවැය ඇස්තමේන්තුව රු.402,355,442 ක් වූ අතර ඒ සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් රු.194,000,000 ක් 2019 ජූලි 07 දින අනුමත වී තිබූ අතර 2021 වර්ෂයේ සභා අරමුදලින් රු.10,000,000 ක්ද වශයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණද ඉතිරි අරමුදල් සොයාගන්නා ආකාරය දක්වා නොතිබුණි. ටෙන්ඩර් කැඳවා ලැබූ ලංසු අතරින් අවම ලංසුව වූ රු.405,022,717 ක මුදලකට මාස 10 කින් නිම කිරීමට 2021 අගෝස්තු 12 දින ගිවිසුම්ගතවී තිබුණි. කොන්ත්‍රාත් සමාගම විසින් ඉදිරිපත් කර තිබූ කාර්යසාධන ඇපකරය හා අත්තිකාරම් ඇපකරය කූඨ ලෙස සකස් කරන ලද ව්‍යාජ ඇපකරයක් වීම හේතුවෙන් මෙහි වැඩ ආරම්භ කිරීම ප්‍රමාද කර තිබුණි. එම ඇපකර ඉදිරිපත් කර තිබූ මූල්‍ය ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් නියාමනය වන ආයතනයක් නොවන බව ශ්‍රී ලංකා මහා බැංකුව විසින් සනාථ කර තිබුණි. 2021 නොවැම්බර් 23 දිනැති සභා වාර්තාවේ මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දක්වා තිබූ නාගරීක ඉංජිනේරුගේ නිර්දේශයට අනුව 2021 දෙසැම්බර් 02 දින කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර 2022 පෙබරවාරි 17 දින නැවත ටෙන්ඩර් කැඳවීම සඳහා සභාව අනුමත කර | අදාල සමාගම අතිරේක ඇස්තමේන්තුවක් සම්බන්ධව ඉල්ලීමක් ඉදිරිපත් කර නොමැති අතර, උපදේශක ආයතනය වගකීම් විරහිතව කටයුතු කිරීම නිරීක්ෂණය වී ඇති හෙයින් අදාල ආයතනය වෙත ගෙවීම් කිරීමේ කටයුතු මේ වනවිට නතර කර ඇති බව දන්වමි. | ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම ඒ සඳහා ප්‍රතිපාදන සලසා ගත යුතු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4 විධිවිධාන ප්‍රකාරව කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් එම සමාගම අසාධු ලේඛනගත නොකිරිම නිසා නැවත කැඳවූ ටෙන්ඩරය සඳහා ලංසු තැබීමට හැකි වීමෙන් 2 වන වර ටෙන්ඩර් කැඳවීමේදී රු.479,642,846 කට ලංසු තබා තිබූ එකම ආයතනය මෙම සමාගම වූ අතර ඇස්තමේන්තු මුදලට වඩා කොන්ත්‍රාත් සමාගමේ ලංසුව අඩු හෙයින් 2022 අප්‍රේල් 27 දින තාක්ෂණික ඇගයීම් කමිටුව මෙම සමාගමට මෙම කොන්ත්‍රාත්තුව ලබා දිය යුතුය යන්න තීරණය කර තිබුණි. කොන්ත්‍රාත් සමාගම මඟින් මෙම ව්‍යාපෘතිය ඉටුකරවා ගැනීම සම්බන්ධයෙන් පත්කර තිබු උපදේශක ආයතනය වගකීම් විරහිතව කටයුතු කර ඇති බවද වැඩි දුරටත් නිරීක්ෂණය විය.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

#### 3.3.1 සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගණකාධිකාරී සේවයේ තනතුරු 03 ක පුරප්පාඩු පැවතීම හේතුවෙන් ප්‍රධාන ගණකාධිකාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. | මේ සඳහා පිළිතුරු නැත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. |

#### 3.3.2 සේවක ණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට 2008 සිට 2019 දක්වා සේවය අතහැර ගිය නිලධාරින් 17 දෙනෙකුගෙන් රු.594,366 ක් ද, 1982 සිට 2021 දක්වා මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 48 දෙනෙකුගෙන් රු.2,088,037 ක් ද හා 2005 සිට 2021 දක්වා මහා නගර සභාවෙන් බැහැරට ස්ථාන මාරුවී ගිය නිලධාරින් 22 දෙනෙකුගෙන් රු.1,929,685 ක් ද වශයෙන් එකතුව රු. 4,612,088 ක ශේෂයක් අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | අදාළ ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. | අය කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 3.4 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ වාහන සමීක්ෂණයෙන් අපහරණය සඳහා නිර්දේශිත වාහන 10 ක් අපහරණය කළ බවට තොරතුරු තිබූ නමුත් එම වාහනවල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන 02 ක් ලියාපදිංචිය අවලංගු කර අපහරණය කළ අතර, ට්‍රැක්ටරය පවත්නා තත්වයෙන් අපහරණය කර ඇති බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුවේ. |